සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අවසාන වාර පරීක්ෂණය 2016

10 ශ්‍රේණිය **81 - කෘෂි හා ආහාර තාක්ෂණය - I** **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකය:

උපදෙස් :

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ඔබට සපයා ඇති බහුවරණ පිළිතුරු පත්‍රයෙහි ප්‍රශ්න අංකයට අදාළව දී ඇති වරණ 04 අතුරින් වඩාත් නිවැරදි වරණය මත × ලකුණ යොදන්න.

---

01 ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු ආරම්භ කරන ලද ජල යෝජනා ක්‍රම අතුරින් විශාලතම ජල යෝජනා ක්‍රමය වනුයේ,

(i) ගල් ඔය (ii) නිල්වලා (iii) මහවැලි (iv) ඉඟිනිමිටිය

02 වර්ෂාපතනය, ආර්ද්‍රතාවය, උෂ්ණත්වය, සුළඟේ වේගය යන කාලගුණික තොරතුරු ලබා ගැනීමට භාවිතයට ගන්නා උපකරණ පිළිවෙලින් දක්වා ඇති පිළිතුර,

(i) වර්ෂාමානය, තෙත් හා වියලි බල්බ උෂ්ණත්ව මානය, උෂ්ණත්ව මානය, අනිල මානය

(ii) අනිල මානය, උෂ්ණත්ව මානය, තෙත් හා වියලි බල්බ උෂ්ණත්ව මානය, වර්ෂා මානය

(iii) තෙත් හා වියලි බල්බ උෂ්ණත්ව මානය, වර්ෂා මානය, උෂ්ණත්ව මානය, අනිල මානය

(iv) වර්ෂාමානය, අනිලමානය, තෙත් හා වියලි බල්බ උෂ්ණත්වමානය, උෂ්ණත්වමානය

03 ආලෝකයේ කාල සීමාව ඍජුවම බලපාන්නේ මෙයින් කවර කාර්යයක් සඳහා ද?

(i) පත්‍ර හටගැනීමට (ii) පුෂ්පිකරණයට (iii) දඬුමුල් ඇද්දවීමට (iv) කඳේ වර්ධනයට


04 දකුණු පස රූප සටහනේ දැක්වෙන්නේ ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන එක්තරා ක්‍රමයක් වන අතර ඒ මගින් වර්ෂාව ලැබෙන ප්‍රදේශ දෙකකි.

(i) පොළොන්නරුව, අම්පාර

(ii) පුත්තලම, කුරුණෑගල

(iii) යාපනය, මන්නාරම

(iv) මහනුවර, කෑගල්ල



05 60 දශකයේ ඇති වූ හරිත විප්ලවය පිළිබඳ කරුණු කීපයක් පහත දැක්වේ.

A ජලගත වගාව හඳුන්වා දීම

B කෙටි කාලයක් තුල වැඩි අස්වනු ලබා දෙන බෝග හඳුන්වා දීම

C කෘෂි රසායන ද්‍රව්‍ය හඳුන්වා දීම

D ගොවිපල යාන්ත්‍රීකරණය වැඩි කිරීම

මෙයින් නිවැරදි පිළිතුර වන්නේ,

(i) A B හා C ය. (ii) A B C හා D ය. (iii) C හා D ය. (iv) B C හා D ය.

06 පාංශු ජනනයට මූලික වන පාෂාණ වලින් ආග්නේය පාෂාණයක් වනුයේ,

(i) ග්‍රැනයිට් (ii) නයිස් (iii) හුණුගල් (iv) කිරි ගරුඩ

07 කාබනික ද්‍රව්‍ය දිරාපත් වී අවසානයේදී හියුමස් බවට පත් වේ. පසක හියුමස් වැඩිපුර අඩංගු වීමෙන් එම පසේ,

(i) කැටායන හුවමාරු ධාරිතාව අඩු වේ. (ii) ජලය රඳවා තබා ගැනීමේ ශක්තිය අඩු වේ.

(iii) ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්වය වැඩිවේ. (iv) පාංශු බාදනය වැඩි වේ.

08 ශිෂ්‍යයෙක් බඳුනක තක්කාලි පැලයක් සිටුවා එයට වැඩිපුර ජලය යොදන ලදී. බඳුන පතුලේ ඇති සිදුරෙන් අතිරික්ත ජලය සියල්ලම බැසගිය පසු බඳුනෙහි ඉතිරිව ඇති ජල වර්ග වන්නේ,

(i) ජලාකර්ෂණ හා කේෂාකර්ෂණ ජලය (ii) ජලාකර්ෂණ හා ගුරුත්වාකර්ෂණ ජලය

(iii) කේෂාකර්ෂණ හා ගුරුත්වාකර්ෂණ ජලය (iv) ජලාකර්ෂණ හා භූගත ජලය

09 වර්තමානයේදී ශ්‍රී ලංකාව කෘෂි පාරිසරික කලාප කීයකට බෙදා වෙන්කර දක්වයි ද?

(i) 40 යි. (ii) 46 යි. (iii) 48 යි. (iv) 52 යි.

10 මේරූ පත්‍ර කහපාට වීමත්, වර්ධනය බාල වීමත්, ශාක කුරුවීමත් යන ලක්ෂණ ශාක විසින් පෙන්නුම් කරන්නේ නම් එම ශාක පෙන්නුම් කරන ඌනතාවයට හේතුවන මූලද්‍රව්‍ය වන්නේ,

(i) මැග්නීසියම් (ii) පොටෑසියම් (iii) නයිට්‍රජන් (iv) පොස්පරස්

11 පස හා සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

A මැටි හා හියුමස් කලීල ලෙස පසේ දැකිය හැකි ය.

B මැටි පසේ පාංශු වාතය වැඩි ය.

C කැටායන හුවමාරු ධාරිතාව මනින ඒකකය පස් 100g ට මිලි සමක නම් වේ.

මින් නිවැරදි ප්‍රකාශ තෝරන්න.


(i) A හා B ය. (ii) A හා C ය. (iii) AB හා C ය. (iv) B හා C ය.

12 පස් කැට පොඩිකිරීම සඳහා සත්ව බලයෙන් ක්‍රියා කරන ගොවි උපකරණයකි.

(i) රොටරි විඩරය (ii) ඇණ දත් පෝරුව

(iii) තැටි නගුල (iv) ජපන් පරිවර්ත්‍ය නගුල

13 පස් සාම්පලයක පාංශු සංඝටක හඳුනාගැනීම සඳහා සිදුකරන ලද පරීක්ෂණයක රූප සටහනක් පහත දැක්වේ. එහි A, B, C, D, E, F, නම් කිරීම පිළිවෙලින්.



(i) ජලයේ අවලම්භනය වූ මැටි අංශු, රොන්මඩ, සියුම්වැලි, රළු වැලි, ගල් හා බොරළු, කාබනික ද්‍රව්‍ය

(ii) ගල් හා බොරළු, සියුම් වැලි, රළු වැලි, ජලයේ අවලම්භනය වූ මැටි අංශු, රොන් මඩ, කාබනික ද්‍රව්‍ය

(iii)රළු වැලි, සියුම් වැලි, රොන් මඩ, ජලයේ අවලම්භනය වූ මැටි අංශු, ගල් හා බොරළු, කාබනික ද්‍රව්‍ය

(iv)ගල් හා බොරළු, රළු වැලි, සියුම් වැලි, රොන් මඩ, ජලයේ අවලම්භනය වූ මැටි අංශු, කාබනික ද්‍රව්‍ය

14 අතුරුයත් ගෑම සම්බන්ධයෙන් ප්‍රකාශ 4ක් පහත දැක්වේ.

A අතුරුයත් ගෑමේදී වල් පැලෑටි ඉවත් කරයි.

B අතුරුයත් ගෑමේදී පසට පොහොර යොදයි.

C අතුරුයත් ගෑමේ දී බෝග පැලෑටි අතර පස් බුරුල් කරයි.

D අතුරුයත් ගෑමේදී බෝග සිටුවීම සඳහා වැටි හා කානු සකසයි.

මින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(i) ABC හා D නිවැරදි ය. (ii) A හා B නිවැරදිය

(iii) AB හා C නිවැරදි ය. (iv) AC හා D නිවැරදි ය.

15 අමුකොල පොහොරක් ලෙස යොදාගත හැකි ශාක වර්ගයක් වන්නේ,


(i) තේක්ක (ii) ග්ලිරිසිඩියා (iii) මහෝගනී (iv) ඇකේෂියා

16 අක්‍රමවත් වැලි අධික භූමියක වගා කොට ඇති ගස්ලබු වගාවකට සුදුසු ජල සම්පාදන ක්‍රමය වන්නේ,

(i) බිංදු ජලසම්පාදනය (ii) බේසම් ජලසම්පාදනය

(iii) පිටාර ජලසම්පාදනය (iv) භූතල ජලසම්පාදනය

17 පහත රූපයේ දැක්වෙන ජලවහන ක්‍රමය හඳුන්වන්නේ,



(i) හෙරින්බෝන් ක්‍රමය ලෙසය.

(ii) ගල් කානු ක්‍රමය ලෙසය.

(iii) කොඩොල් කානු ලෙසය.

(iv) සමාන්තර ක්‍රමය ලෙසය.

18 වාර්ෂික බෝගයක් නොවන බෝගයකි.

(i) මිරිස් (ii) ගම්මිරිස් (iii) මුං (iv) කරවිල

19 නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) වැලි පසට ජලය සැපයිය යුත්තේ වැඩි කාලාන්තරයකින් වැඩි ප්‍රමාණයකිනි.

(ii) මුං, කව්පි, ඉදල් ඉරිඟු ආදි බෝග වලට ජල අවශ්‍යතාවය වැඩිය.

(iii) වී වගාවේ දී බිම් සැකසීමට අවශ්‍ය වන්නේ අඩු ජල ප්‍රමාණයකි.

(iv) බෝගයක් වැඩෙන අවධියට වඩා ඵල දරන අවධියේදී වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය වේ.

20 වර්ෂයක් තුළ දක්නට ලැබෙන දිවා කාලයේ දිග වැඩිම හා අඩුම දින ලෙස සලකන්නේ පිළිවෙලින්,

(i) මාර්තු 23 හා දෙසැම්බර් 23 (ii) ජූලි 28 හා දෙසැම්බර් 31

(iii) ජූනි 21 සහ දෙසැම්බර් 21 (iv) මැයි 31 සහ දෙසැම්බර් 21

21 ඇරිකේෂියේ කුලයට අයත් බෝග කාණ්ඩයකි.

(i) වී, කුරහන්, බඩ ඉරිඟු (ii) බටු, මිරිස්, තක්කාලි

(iii) පොල්, පුවක්, කිතුල් (iv) දොඩම්, දිවුල්, දෙහි

22 තවානක් සඳහා ස්ථානයක් තෝරා ගැනීමේ දී අප විසින් සලකා බැලිය යුතු කරුණක් නොවන්නේ,

(i) හොඳින් හිරු එළිය ලැබෙන ස්ථානයක් වීම

(ii) ජල වහනය හොඳින් සිදුවන ස්ථානයක් වීම

(iii) බාහිර උපද්‍රව වලින් තොර ස්ථානයක් වීම

(iv) පෙර කන්නයේ එම වර්ගයේ ම බීජ තවාන් දැමූ ස්ථානයක් වීම

23 වියලි කලාපයේ බහුලව දක්නට ලැබෙන පස් වර්ගය වන්නේ,

(i) රතු දුඹුරු පස් (ii) දියලු පස්

(iii) ලෝම පස් (iv) රතු කහ පොඩ්සොලික් පස්

24 වෛරස් රෝග කාරක ධාරක ශාකයක් ලෙස ක්‍රියාකරන වල් පැලෑටියකි.

(i) ඇටවරා (ii) හුලංතලා (iii) සැල්වීනියා (iv) මොනරකුඩුම්බිය

25 බෝග වලට වැළඳෙන රෝග අතුරින් බැක්ටීරියා මඟින් ඇතිවන රෝගයකි.

(i) දිය මලං කෑම (ii) හිටු මැරීම

(iii) විචිත්‍ර වෛරස් (iv) විචස් බ්‍රෑම් (Witches broom)

26 වල් පැලෑටි වල දක්නට ලැබෙන පොදු ලක්ෂණ අතර දැකිය නොහැක්කේ,

(i) ජීවන චක්‍රය කෙටි වීම (ii) එකවර විශාල බීජ සංඛ්‍යාවක් නිපදවීම

(iii) පලිබෝධ වලට ඔරොත්තු නොදීම (iv) විවිධ ක්‍රමවලට ව්‍යාප්ත වීමේ හැකියාව

27 පලිබෝධ පාලන ක්‍රම අතුරින් පරිසර හානිය වැඩිපුර සිදුවන ක්‍රමයක් ලෙස හඳුනාගත හැක්කේ,

(i) කෘෂිකාර්මික ක්‍රමය (ii) ජෛව විද්‍යාත්මක ක්‍රමය

(iii) ඒකාබද්ධ පලිබෝධ පාලනය (iv) රසායනික ක්‍රම භාවිතය

28 පොල් ශාකයක කඳ කොටසට රතු පොල් කුරුමිණියාගේ ජීවන චක්‍රයේ කුමන අවස්ථාවේ දී හානි සිදු කරනු ලබයි ද?

(i) කීට (ii) සුහුඹුල් (iii) කෝෂ (iv) ශිශු

29 බෝග වගා කටයුතු වලදී ජෛව පාලනය සඳහා උදව්දෙන කෘමියෙකු ලෙස හඳුනාගත හැක්කේ,

(i) කීඩැවා (ii) පළතුරු මැස්සා (iii) ගොයම් මැස්සා (iv) බත් කුරා

30 රසායනික පොහොර සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ. ඉන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

A යූරියා වලින් නයිට්‍රජන් ලබාදෙන අතර ඒවා ගෝලාකාර කැට විශේෂයකි.

B කුඩු ලෙස පවතින ට්‍රිපල් පොස්පේට් රතු වර්ණයක් ගනී.

C පැහැයෙන් රතු මියුරියේට් ඔෆ් පොටෑෂ් කුඩු ස්වභාවයක් ගනී.

(i) A හා C නිවැරදියි. (ii) A හා B නිවැරදියි. (iii) B හා C නිවැරදියි. (iv) A B හා C නිවැරදියි.

31 පාංශු සංරක්ෂණ ක්‍රම අතුරින් යාන්ත්‍රික ක්‍රම යටතට අයත් වන්නේ,

(i) හෙල්මළු දැමීම (ii) ආවරණ බෝග වගාව

(iii) සමෝච්ඡ ක්‍රමයට බෝග වගාව (iv) මිශ්‍ර බෝග වගාව

32 තවාන් පැල ''දැඩි කිරීම'' යනුවෙන් හඳුන්වන්නේ,

(i) තවාන් පැල වලට වැඩි පෝෂණයක් ලබා දීම

(ii) තවාන් පැල ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්ත්වයට පත් කරීම

(iii) පශ්චාත් සාත්තු ඉතා හොඳින් පවත්වාගෙන යාම

(iv) තවාන් පැල වලට සෙවන ලබා දීම

33 තවාන් වසුන් කිරීම සඳහා යොදාගන්නා ස්වාභාවික ද්‍රව්‍යයක් නොවන්නේ,

(i) අලුත් පිදුරු (ii) වියලි මානා (iii) පිරිසිදු ගෝනි (iv) පොලිතින්

34 වාණිජ ව්‍යාපාරයක් ලෙස මෙන්ම සුළු පරිමානයේ ගෙවතු සඳහා ගොඩ ක්‍රමයට කොම්පෝස්ට් නිපදවීමේදී තෝරාගත් ස්ථානයේ පස බුරුල් නම් බර ලී කුට්ටියක් (තාප්ප මෝලක්) භාවිතයෙන් පස තද කිරීමේ මූලික අරමුණ.

(i) කොම්පෝස්ට් වලට වැසි ජලය කාන්දු වීම වළකාලීම

(ii) අමුද්‍රව්‍ය වලට ක්ෂුද්‍රජීවීන්ගෙන් විය හැකි හානිය වළකාලීම

(iii) පෝෂක පස තුලට ගලායාම වළක්වාලීම

(iv) කොම්පෝස්ට් ගොඩට බාහිර ද්‍රව්‍ය එක්වීම වලක්වාලීම

35 ශ්‍රී ලංකාවේ මධ්‍යම වී අභිජනන මධ්‍යස්ථානය වූ බතලගොඩ මධ්‍යස්ථානයෙන් හඳුන්වා දුන් පළමු දෙමුහුම් වී ප්‍රභේදය වන්නේ,

(i) H 4 (ii) B g 300 (iii) B g 3 5 (iv) B W 351

36 වී බීජ තවාන් කිරීම සඳහා කුටීර සහිත තැටි භාවිතා කිරීම නූතනයේ ජනප්‍රිය ක්‍රමයක් වන අතර එම එක් කුටීරයක තැන්පත් කරන බීජ සංඛ්‍යාව වන්නේ,

(i) 1 2 කි. (ii) 3 4 කි. (iii) 2 3 කි. (iv) 4 5 කි.

37 වාර්ෂික පැලෑටියක් වූ ''වී ශාකය'' අයත් ශාක කුලය වන්නේ,

(i) සොලනේසියේ (ii) පොඒසියේ (iii) මැල්වේසියේ (iv) රුටේසියේ

38 වැඩි දියුණු කළ වී ප්‍රභේදයක ලක්ෂණ අයත් වරණය තෝරන්න.

(i) ශාකය මිටිය, පඳුරු දැමීම වැඩිය, පලිබෝධ හානි වැඩිය, අස්වනු වැඩිය.

(ii) ශාකය උසය, පඳුරු දැමීම වැඩිය, පලිබෝධ හානි අඩු ය, අස්වනු වැඩිය.

(iii) ශාකය උසය, පඳුරු දැමීම වැඩිය, අස්වනු වැඩිය, පලිබෝධ හානි අඩුය.

(iv) ශාකය මිටිය, පඳුරු දැමීම අඩුය, අස්වනු අඩුය, පලිබෝධ හානි අඩුය.

39 කෘෂි කර්මාන්තයේදී කොහොඹ ඇට සාරය යොදාගන්නා අවස්ථාවක් වන්නේ,

(i) බීජ අක්‍රියතාව ඉවත් කිරීමට (ii) වල් පැලෑටි පාලනයට

(iii) දඬු කැබලි මුල් ඇද්දවීමට (iv) හානිකර කෘමි සතුන් පාලනයට

40 ශ්‍රී ලංකාවේ 2016 වර්ෂයේ අවසාන භාගයේ දී කඩිනම් කරන ලද බහු කාර්ය ජල යෝජනා ක්‍රමය වන්නේ,

(i) ගල් ඔය (ii) මොරගහ කන්ද (iii) දැදුරු ඔය (iv) සමනල වැව

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අවසාන වාර පරීක්ෂණය 2016

10 ශ්‍රේණිය **81 – කෘෂි හා ආහාර තාක්ෂණය – II** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකය:

උපදෙස් :
- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- ඉතිරි ප්‍රශ්න හයෙන් 04 කට පමණක් පිළිතුරු සපයන්න.

---

01 නාගරික පරිසරයක පිහිටුවා තිබූ සේනානායක විද්‍යාලයේ පැවති කෘෂිවිද්‍යා ප්‍රදර්ශනයේදී 10 වසර සිසුන්ට පැවරී තිබුනේ ආදර්ශමත් පාසල් ගෙවත්තක් පවත්වාගෙන යාමයි.

(i) මෙම ගෙවත්ත සඳහා ස්ථානයක් තෝරා ගැනීමේදී සලකා බැලූ කරුණු දෙකක් ලියන්න.

(ii) එහිදී ඔවුන් යොදාගත් මිනිස් ශ්‍රමයෙන් ක්‍රියා කරන කාර්යක්ෂම බහු කාර්ය උපකරණය කුමක් ද?

(iii) බෝගයක් සිටුවීමට ස්ථීර බඳුනක් නිවැරදිව පුරවන ආකාරය නම් කළ රූප සටහනකින් ඇඳ පෙන්වන්න.

(iv) ආරක්ෂිත වැට සැකසීමට යොදාගත් කොල පොහොර ලබා ගත හැකි ශාකයක් නම් කරන්න.

(v) ආරුක්කු වලට යවා තිබූ ෆැබේසියේ කුලයේ බෝග 2ක් නම් කරන්න.

(vi) ගෙවත්තේ වගා කර තිබූ කෘමි විකර්ශක ශාකයක් ලියන්න.

(vii) මිරිස් ශාකවල කොල කොඩවී (පත්‍ර විකෘති වී) තිබුනි. එහි රෝග කාරකයා නම් කරන්න.

(viii) ශාක වර්ධනයට අවශ්‍ය ක්ෂුද්‍ර පෝෂක 2ක් ලියන්න.

(ix) පේලියට තබා තිබූ බඳුන් සඳහා ජලය සැපයීමට සුදුසු ජල සම්පාදන ක්‍රමයක් නම් කරන්න.

(x) පාසල් ගෙවත්තක් පවත්වාගෙන යාමෙන් ලැබෙන වාසි 2ක් ලියන්න. (ල. 20)

02 කෘෂි කර්මාන්තයේදී බෝග වගාව කෙරෙහි දේශගුණික සාධක ඍජුවම බලපායි.

(i) (a) සරල වර්ෂාමානයක් ඇඳ එහි කොටස් නම් කරන්න. (ල. 02)

(b) වර්ෂාමානයක් ස්ථානගත කිරීමේදී සලකා බැලිය යුතු කරුණු දෙකක් ලියන්න. (ල. 02)

(ii) වායුගෝලීය වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාවයක් බෝග වගාවට හිතකරව සහ අහිතකරව බලපාන ආකාර දෙක බැගින් ලියන්න. (ල. 02)

(iii) (a) ප්‍රභා අවධි සංවේදී ශාක බෙදා වෙන් කරන ප්‍රධාන කාණ්ඩ දෙකක් නම් කරන්න. (ල. 02)

(b) ඒවාට උදාහරණය බැගින් ලියන්න. (ල. 02)

03 බෝග වගාවේදී පසෙහි ඇතිවන බලපෑම සහ එහි වැදගත්කම පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

(i) (a) පාංශු සංඝටක 4ක් ලියන්න. (ල. 02)

(b) පාංශු ව්‍යුහ ආකාර දෙකක් නම් කර ඉන් එකක රූප සටහනක් ඇඳ පෙන්වන්න. (ල. 02)

(ii) (a) පාංශු ජීවීන් මගින් පසට ඇති කරන හිතකර බලපෑම් දෙකක් ලියන්න (ල. 02)

(b) පසේ පවතින ජල ආකාර 3 නම් කර ඉන් ශාකවලට ප්‍රයෝජනයට ගත හැකි ජල වර්ගය නම් කරන්න. (ල. 02)

(iii) පාංශු බාදනයේ අහිතකර බලපෑම් 4ක් ලියන්න. (ල. 02)

04 බෝග වගා කිරීමේදී බිම් සැකසීමේ ක්‍රියාවලිය ඉතා වැදගත් කරුණක් ලෙස හැඳින්විය හැක. මෙහිදී බිම් සැකසීම පියවර අනුව සිදුකළ යුතු ය.

(i) (a) මූලික බිම් සැකසීමේ පියවර දෙක ලියන්න. (ල. 02)

(b) එම පියවර දෙක සඳහා යොදා ගන්නා උපකරණ දෙකක් බැගින් ලියන්න. (ල. 02)

(ii) (a) කෙසෙල්, ගොටුකොල, රටකජු, මිරිස් යන බෝග සඳහා සුදුසු පාත්ති වර්ග 4 ලියන්න. (ල. 02)

(b) අවිධිමත්ව බිම් සැකසීම නිසා සිදුවන හානි දෙකක් ලියන්න. (ල. 02)

(iii) පැල සිටුවීමේ යන්ත්‍රයෙන් ගොයම් පැල සිටුවීමෙන් ලැබෙන වාසි දෙකක් ලියන්න. (ල. 02)

05 පලිබෝධ හානි බෝග වගාවේදී ඵලදාව අඩු වීමට බලපාන එක් සාධකයක් ලෙස ගත හැක. එම නිසා පළිබෝධ පාලනය කිරීම ඉතා වැදගත් වේ.

(i) ප්‍රධාන පළිබෝධ භාණ්ඩ 3ක් නම් කර ඒවාට උදාහරණ දෙක බැගින් ලියන්න. (ල. 03)

(ii) (a) වල් පැලෑටියක් යනු කුමක්දැයි අර්ථ දක්වන්න. (ල. 01)

(b) වල් පැලෑටි නිසා සිදුවන හානි 4ක් ලියන්න. (ල. 02)

(c) වල් පැලෑටි මර්දනය කරන යාන්ත්‍රික ක්‍රම දෙකක් ලියන්න. (ල. 01)

(iii) (a) සම්පූර්ණ රූපාන්තරණයේ අවස්ථා 4 ලියන්න. (ල. 02)

(b) ඔබ ගෙවත්තේ බෝගවලට වැලඳෙන රෝග වලක්වා ගැනීමට ඔබ ගන්නා පියවර 2ක් ලියන්න. (ල. 01)

06 කාබනික පොහොර යොදා පසෙහි භෞතික, රසායනික හා ජෛව ලක්ෂණ සංවර්ධනය කර ගනිමින් බෝගයේ පෝෂණ අවශ්‍යතා සපිරෙන පරිදි රසායනික පොහොර යෙදීමට වර්තමාන ගොවීන් පෙළඹී ඇත.

(i) (a) මෙම ක්‍රමය හඳුන්වන නම කුමක්ද? (ල. 02)

(b) කාබනික පොහොර සහ රසායනික පොහොර යෙදීමේ වාසි දෙක බැගින් ලියන්න. (ල. 02)

(ii) ගොඩ ක්‍රමයට කොම්පෝස්ට් සකසන ආකාරය පහත මාතෘකාව යටතේ විස්තර කරන්න.

(a) ස්ථානය සූදානම් කිරීම (ල. 01)

(b) අමුද්‍රව්‍ය ඇසිරීම (ල. 02)

(c) ගොඩ පෙරලීම (ල. 01)

(iii) පහත වගුව සම්පූර්ණ කරන්න.

පොහොර වර්ගය	පෝෂක ප්‍රතිශතය	භෞතික ලක්ෂණ
මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP)	A	රතු දුඹුරු පාටය, ජලයේ දියවන කුඩා ස්ඵටික වේ.
යූරියා	B	C .....
D	P_2O_2 45%	ලා අලු පැහැතිය. ගෝලාකාර කැට වේ. ජලයේ මදක් දියවේ.

(ල. ½ x 4 = 02)

07 වී වගාවේදී අධික ලෙස රසායනික පොහොර භාවිතය සෞඛ්‍යමය ගැටළු රැසක් ඇති කරන නිසා විකල්ප ක්‍රම කෙරෙහි අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවයක් ලෙස සැලකේ.

(i) (a) වී වගාව සඳහා භාවිතා කළ හැකි කාබනික පොහොර වර්ග 4ක් ලියන්න. (ල. 02)

(b) ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන පැරණි වී ප්‍රභේද දෙකක් සහ වැඩි දියුණු කළ නව වී ප්‍රභේද දෙකක් ලියන්න. (ල. 02)

(ii) (a) වී වගාවට අවශ්‍ය පාරිසරික සාධක දෙකක් නම් කරන්න. (ල. 01)

(b) බිත්තර වී සාම්පලයක තිබිය යුතු ප්‍රමිති 4ක් දක්වන්න. (ල. 02)

(iii) (a) වී වගාවට හානි කරන වල් පැලෑටි වර්ග 4ක් ලියන්න. (ල. 01)

(b) වී වගාවේදී වැපිරීමට වඩා පැල සිටුවීමේ ඇති වාසි දෙකක් ලියන්න. (ල. 02)

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(iii)	2 -(i)	3 -(ii)	4 -(iv)	5 -(iv)	6 -(i)	7 -(iii)	8 -(i)	9 -(ii)	10 -(iii)
11 -(ii)	12 -(ii)	13 -(iv)	14 -(iii)	15 -(ii)	16 -(i)	17 -(iv)	18 -(ii)	19 -(iv)	20 -(iii)
21 -(iii)	22 -(iv)	23 -(i)	24 -(ii)	25 -(ii)	26 -(iii)	27 -(iv)	28 -(i)	29 -(iv)	30 -(i)
31 -(i)	32 -(ii)	33 -(iv)	34 -(iii)	35 -(i)	36 -(iii)	37 -(ii)	38 -(i)	39 -(iv)	40 -(ii)


(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් / 1 පත්‍රය මුළු ලකුණු 40 යි.)

II කොටස

(01) (i) පීරු එළිය හොඳින් ලැබෙන ස්ථානයක් වීම, ජල පහසුකම් සහිත ස්ථායක් වීම, සමතලා බිමක් වීම, ජලවහනය හොඳින් සිදුවන ලෝම පසක් වීම, නිතරම අවධානය යොමු කළ හැකි ස්ථානයක් වීම, රෝගී වගාවන් නැති ස්ථානයක්, ප්‍රවාහන පහසුකම් සහිත ස්ථාන (ල. 02)

(ii) උදැල්ල (ල. 02)

(iii)



(ල. 02)

(iv) ග්ලිරිසීඩියා, එරබදු, ඉපිල් ඉපිල් (ල. 02)

(v) මැ, අවර, දඹල, බෝංචි යනාදී සුදුසු පිළිතුරකට (ල. 02)

(vi) දහස්පෙතියා, කපුරු, සූරියකාන්ත (ල. 02)


(vii) වෛරස් (ල.02)

(viii) සින්ක් කොපර්, මැංගනීස්,මොලිබ්ඩිනම්, බෝරෝන්, යකඩ, ක්ලෝරීන් (ල. 02)

(ix) බිංදු ජලසම්පාදන ක්‍රමය (ල. 02)

(x) සුදුසු පිළිතුරු 2කට ලකුණු දෙන්න (ල. 02)

02 (i) (a)



(ල. 02)

(b) එළිමහන් ස්ථායක් වීම,ආසන්නයේ ගොඩනැගිලි හෝ උස් ශාක ඇත්නම් ඒවායේ උස මෙන් දෙගුණයක් දුරින් හෝ ඊට වැඩි දුරකින් වර්ෂාමාන ස්ථානගත කිරීම, පුනීල කට පොළව මට්ටමේ සිට 30 cm ක් උසින් සිටින සේ තැබීම, සුළඟට පෙරලීම හා සතුන්ගෙන් හානි සිදු නොවන පරිදි පිහිටුවීම, තණකොළ සහිත භූමියක් විය යුතු ය.(ල. 02)

(ii) හිතකර බලපෑම් දඬු කැබලි මුල් ඇද්දවීම, සමහර විසිතුරු ශාක වර්ධනයට (බෙගෝනියා, පර්ණාංග) පරාගනයේදී කලංකය ග්‍රාහීය කාලය පවත්වා ගැනීම (ල. 02)

අහිතකර බලපෑම් ශාක රෝග ආසාදනය වැඩි වීම, පලිබෝධ ව්‍යාප්තිය වැඩිය., සුළඟ මගින් සමහර පරාග විසිර යාමට බාධා ඇති වීම, උත්ස්වේදනය අඩු නිසා ජලය හා පෝෂක අවශෝෂණය අඩු වීම, ගබඩා කරන ලද බීජ පළිබෝධ හානි වලට ලක් වීම. (ල. 02)

(iii) කෙටි දින ශාක උක්, කෝපි, මුං, ස්ට්‍රෝබෙරි, දුම්කොළ

දිගු දින ශාක බීට්, කැරට්, රාබු, සලාද, එෑණු, අර්තාපල් (ල. 02)

03 (i) ඝන ද්‍රව්‍ය (පාංශු ඛණිජ, පාංශු කාබනික ද්‍රව්‍ය)

(a) පාංශු වාතය, පාංශු ජලය, පාංශු ජීවීන් (ල. 02)

(b) ස්ථම්බික, තනි කනිකා, අණු කෝණාකාර කුට්ටි, ... රූපසටහන් වලට අදාලව (නම් කිරීමට ල. 01, රූප සටහනට ල. 01)

(ii) (a) •කාබනික ද්‍රව්‍ය වියෝජනය කිරීම (දිලීර, බැක්ටීරියා) • පස මිශ්‍ර කිරීම, • ඇලෙනසුළු ද්‍රව්‍ය පිට කිරීම නිසා පාංශු කැටිති ඇති වීම, • නයිට්‍රජන් තිර කිරීම (ල. 02)

(b) ගුරුත්වාකර්ෂණ ජලය, ජලාකර්ෂණ ජලය, කේශාකර්ෂණ ජලය

(ල. ජල ආකාර 3 x ½ = 1 ½)

කේෂාකර්ෂණ ජලය (නම් කිරීමට ½)

(iii) • ශාක වර්ධනය සඳහා සුදුසු පාංශු ස්ථරයේ ඝනකම අඩු වීම • ශාක පෝෂණ ඌනතාවලට ගොදුරු වී වර්ධනය බාල වීම • මූල මණ්ඩල අවට පස සෝදා යාම නිසා ගස් ඇද වැටීම •කෘෂිකාර්මික ඉඩම්වල වටිනාකම අඩු වීම • ඉවත්වන පස් ජලාශවල තැන්පත් වීම නිසා ගංවතුර ඇති වීම ආදී පිළිතුරු (ල. 02)

04 (i) (a) ප්‍රාථමික බිම් සැකසීම, ද්විතීක බිම් සැකසීම (ල. 02)

(b) ප්‍රාථමික උදාහරණ උදැල්ල,නගුල් වර්ග, හැඩ ලැලි නගුල, ජපන් පරිවර්ත්‍ය නගුල, ගැමිලි නගුල, සැහැල්ලු යකඩ නගුල, උදලු මුල්ලුව, පා මුල්ලුව
ද්විතියික උදැල්ල, පෝරු වර්ග අත් පෝරුව, තල පෝරුව, ඇනදත් පෝරුව දැති පෝරුව (කොකු නගුල) රේක්ක, රිජරය රොටවේටරය (ප. 02)

(ii) (a) කෙසෙල් තනි වගා වලවල් ගොටුකොල ගිල්වූ පාත්ති
රටකජු වැටි හා කානු මිරිස් උස් පාත්ති (ල. 02)

(b) පාංශු බාදනය වීම, පසේ පෝෂක විනාශ වීම, බෝග වගා කළ නොහැකි වීම, බීජ අපතේ යාම, වල් පැල වර්ධනය වීම වැනි කරුණු 2 කට (ල. 02)

(iii) අවශ්‍ය බීජ ප්‍රමාණය අඩු වන අතර බීජ සඳහා වියදම ද අඩු වීම, වල් මර්දනය පහසු වීම, කාලය හා ශ්‍රමය ඉතිරි වීම, කාර්යක්ෂම වීම වැනි කරුණු 2 කට (ල. 02)

05 (i) (a) වගා කරන ලද බෝගය හැරුණු විට එම වගා බිමෙහි වැඩෙන ඕනෑම පැලෑටියක් වල් පැලෑටියක් ලෙස හඳුන්වනු ලැබේ. (ල. 01)

(b) රෝග :
කෘමි හා කෘමි නොවන: සුදුසු උදාහරණ වලට ලකුණු දෙන්න (ල. 03)
වල් පැලෑටි :

(ii) (a) • පෝෂක, හිරු එළිය, ඉඩකඩ සඳහා බෝගය සමග තරගකාරීබව නිසා වේගය දුර්වල වී අස්වැන්න අඩු වීම, • සමහර වල් පැල කටු සහිත වීම නිසා පාලනය අපහසු වීම • සමහර පළිබෝධ සත්ව වර්ග මෙහි සැඟව සිටීම • සමහර කෘමි පළිබෝධවල ජීවන චක්‍රය සම්පූර්ණ කිරීමට මෙහි ඉඩ ලැබීම • රෝග කාරක ජීවීන්ට ධාරක ශාකයන් වීම • ජල මාර්ග අවහිර වීම • භූමිවල කෘෂිකාර්මික වටිනාකම අඩු වීම• සමහර වල් පැලෑටි මිනිසාට හා සතුන්ට විෂ සහිත වීම • වල් මර්ධනය සඳහා මුදලක් වැය වීම (ල. 02)

(b) අතින් උදුරා දැමීම, උදලු ගෑම, යන්ත්‍ර භාවිතය, ජලය බැඳීම, වල් පැලෑටිවල වායව කොටස කපා පුලුස්සා දැමීම වැනි සුදුසු කරුණු දෙකකට ලකුණු දෙන්න. (ල. 01)

(iii) (a) බිත්තර, කීට, පිලා(කෝෂ), සුනුඹුල් අවධිය (ල. 02) (b) සුදුසු පිළිතුරු දෙකකට ලකුණු දෙන්න. (ල. 01)

06 (i) (a) ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණය වේ. (ල. 02)

(b) <u>කාබනික පොහොර</u>

• ශාකවලට අවශ්‍ය සියලුම පෝෂ්‍ය පදාර්ථ අඩංගු බැවින් පූර්ණ පොහොරක් වේ. • තිරස් කැටායන හුවමාරු ධාරිතාව වැඩි දියුණු කරයි. • පාංශු ව්‍යුහය හා ජල අවශෝෂණ ධාරිතාව වැඩිදියුණු කරයි. • පසේ ක්ෂුද්‍රජීවී ගහනය වැඩි කරයි. • ස්වාරක්ෂණයක් ලෙස ක්‍රියා කරයි. (ල. 01)

<u>රසායනික පොහොර</u>

• ශාක වලට ඉක්මනින් අවශෝෂණය කිරීම • ශාක දක්වන උෂ්ණතාවයන්ට අනුව යෙදිය හැකි වීම
• යෙදීම පහසු වීම • ප්‍රවාහන පහසුව • අඩු ඉඩක ගබඩා කිරීමට හැකි වීම (ල. 01)

(ii) • ශාක හා සත්ව පොහොර තට්ටු මාරුවෙන් මාරුවට ඇසිරීම • තට්ටු තුනකට වරක් මුහුම් යෙදීම • අවශ්‍ය නම් තට්ටු 3, 4 වරක් රොක් පොස්පේට් ඉසීම • අවසානයේදී කලු පොලිතීනයකින් ගොඩ ආවරනය කිරීම
• වාතාශ්‍රය ලැබීම සඳහා ගොඩෙහි දෙපසින් පොළව මට්ටමේ සිට 30 cm ක් පමණ නොවැසිය යුතු ය.

(c) 1 පෙරලීම මාස 1 කට පසුව 2 පෙරලීම පළමු පෙරලීමෙන් මාස 1 කට පසු 3 පෙරලීම දෙවන පෙරලීමෙන් මාස 1 කට පසු (ල. 01)

(iii) A - K_2O 60% B - N 46% C සුදු පැහැති ගෝලාකාර ස්ඵටික වේ.ජලයේ හොඳින් දියවේ. එවිට ජලය සිසිල් වීම. ..... ජලවාෂ්ප අවශෝෂණය කර ගනියි. D ත්‍රිත්ව සුපර් පොස්පේට් (ල. 02)

07 (i) (a) පිදුරු, ගොම පොහොර දහයියා අඟුරු, කොල පොහොර, කුකුල් පොහොර, පොස්පෝ කොම්පෝස්ට් ආදී පිළිතුරුවලින් (ල. 02)

(b) පැරණි සුවඳැල්, කළු හීනටි, කුරුළු තුඩ, පච්චපෙරුමාල්,හැටදා වී, රත් දැල්
වැඩිදියුණු කළ ප්‍රභේද Bg 300, BW 351, H4, Bg 450, Bg 459 Bg 35 (ල. 02)

(ii) (a) පස, ජලය, ආලෝකය,උෂ්ණත්වය (ල. 01)

(b) පැලවීමේ ශක්තිය 85% තෙතමනය 13%
වගී පවිත්‍රතාවය 98% හානිකර වල් පැලෑටි බීජ සංඛ්‍යාව උපරිම 5%ට අඩු
යාන්ත්‍රික හානි අවම වීම (ල. 02)

(iii) (a) බටදැල්ල, දිය හබරල, තුන්හිරිය, ගිරාපලා, මාරුක්, බපිරි, ගොපිරි ආදී සුදුසු පිළිතුරු 4ක් (ල. 01)

(b) බීජ සංඛ්‍යාව අඩුය, ක්ෂේත්‍රය සියුම්ව සකස් කළ යුතු නොවේ. අවශ්‍ය ජල ප්‍රමාණය අඩුය, වල්පැල ඇතිවීම අඩු ය, ක්ෂේත්‍රයෙන් කොටසක් පළමුව සකසා ඉතිරිය පසුව සකස් කල හැක, ආදී පිළිතුරු වලින් 2ක් සඳහා (ල. 02)